# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 50 දරන
# පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි	තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 50 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 2/79.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 50 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— — ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පනතේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

' අර්ථනිරූපණය. 13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයා" යන්නෙන්—

(අ) 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ් සභා ආඥාව යටතේ පිහිටුවන ලද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ; හෝ

(ආ) 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන වගන්තියේ අර්ථානුකූල ව ප්‍රථම ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු ද ඇතුළුව, 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ් සභා ආඥාව යටතේ පිහිටුවන ලද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ; හෝ

(ඇ) 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 161 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූල ව ප්‍රථම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ද ඇතුළුව, 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබූ; හෝ

(ඈ) 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබූ

තැනැත්තෙක් අදහස් වේ.'.

2—ඒ 42617—11,500 (79/07)